බ්‍රහ්මදත්ත රජතුමා බරණැස් නුවර රජ කරමින් සිටියේය. බරණැස් නුවර අවට නොයෙක් ගම් දනව් පිහිටියේය. ඊට මඳක් ඈතින් පිහිටි එක් ගමක මහලු ස්ත්‍රියක් වාසය කළාය. නුවරින් ආ එක් පුද්ගලයෙක් එක් රැයක් ඇයගේ ගෙයි නවාතැන් ගෙන කුලිය වශයෙන් ඇයට වසු පැටවෙකු තෑගි කළේය.


(c) Sumitha Publishers


(c) Sumitha Publishers

මහලු කාන්තාව වසු පැටවා හොඳින් රැක බලා ගත්තාය. වසු පැටවා කළු පාට වූ නිසා ඔහුට ‘ආරියකාකාල’ යන නම දෙන ලදී. ගවපල්ලන් විසින් රැක බලා ගන්නා වෙනත් ගව රංචු සමඟ මේ ගවයා ද ගම පුරා ඇවිද්දේය. ගම් දරුවෝ ඔහු සමඟ සෙල්ලම් කළෝය.



මෙසේ හැදී වැඩුණු ඔහු හොඳ ශක්තිමත් ගොන් නාම්බෙකු බවට පත් විය. දිනක් ඔහු මෙසේ සිතුවේය: ‘මා හදා වඩා ගත් මගේ මෑණියෝ ඉතා ම වයසට ගොස් දැන් දුර්වල යි. කුමක් හෝ කුලී වැඩක් කර ඇයට මුදල් ලබා දිය යුතු යි’ මෙසේ සිතූ ඔහු කුලී වැඩක් සොයසොයා ඇවිද්දේය.

(c) Sumitha Publishers